# තොටගමුවේ විජයබා පිරිවෙන සමකාලීන අනෙකුත් පිරිවෙන් අතරින් විශිෂ්ටතම විද්‍යායතනය වුණි ද?

ජේ. කේ. යූ. රංගිකා
විශේෂවේදී තෙවන වසර
ඉතිහාස අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය
ushani.jayasinghe10@gmail.com

**සංක්ෂේපය**

අඩ සිය වසකටත් වැඩි කලක් පැවති සවැනි පරාක්‍රමබාහු රජුගේ රාජ්‍ය කාලය තුළ උසස් ගණයේ අධ්‍යාපන ආයතන බොහෝ ගණනක් ලක්දිව පුරා පැවතුණි. තොටගමුවේ විජයබා පිරිවෙන, කැරගල පද්මාවතී පිරිවෙන, වීදාගම ශ්‍රී ඝනානන්ද පිරිවෙන, දෙවිනුවර තිලක පිරිවෙන සහ පැපිලියානේ සුනේත්‍රා දේවි පිරිවෙන යනාදී වශයෙන් හැඳින්විය හැකි ය. සමකාලීන ග්‍රන්ථයන්ගෙන් පැහැදිලි වන අන්දමට උසස් තත්වයක පැවති මේ විද්‍යායතනයන් නිසා රට පුරාම ශාස්ත්‍රාලෝකය පැතිර යන්නට විය.

මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේල තොටගමුවේ විජයබා පිරිවෙන සමකාලීන අනෙකුත් පිරිවෙන් අතරින් විශිෂ්ටතම විද්‍යායතනය වුණි ද? යන්න විමසා බැලීම යි. ඒ සඳහා ප්‍රාථමික මූලාශ්‍රය හා ද්විතික මූලාශ්‍රය අධ්‍යයනය මෙහි ක්‍රමවේදය විය.

ලක්දිව දකුණු දිග තොටගමුව නම් ග්‍රාමයේ තොටගමුව විහාරයට යාබදව විජයබා පිරිවෙන පිහිටා ඇත. ප්‍රස්තුත කාලයට අදාළව ලෞකික විෂයන් ඉගැන්වීමේ උසස්තම විද්‍යායතනය වූයේ විජයබා පිරිවෙන යි. එමෙන්ම කෝට්ටේ යුගයේ ශ්‍රේෂ්ඨතම පඬිවරයාණන් වූ තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් එහි අධිපතීත්වය දරන ලදී. සමකාලීන පිරිවෙන් මෙන් නොව විදේශිකයන්ගේ ද ගෞරවයට පාත්‍ර වූයේ මෙම විද්‍යායතනය යි. මෙකී පිරිවෙනින් අධ්‍යාපනය ලත් ශ්‍රී රාමචන්ද්‍ර භාරතී විසින් විද්‍යායතනයේ ගුරුන් පිළිබඳ ප්‍රශංසාත්මකව ලියනු ලැබුවේ ඒ නිසාවෙන් බව කිව හැකි ය. කෝට්ටේ යුගය හැඳෑරීමට ප්‍රාථමික මූලාශ්‍රයෝ වන සන්දේශ කාව්‍යන්හි ද විජයබා පිරිවෙන සෙසු පිරිවෙන් සමගාමීව වර්ණනාත්මකව දැක්වූයේ එබැවිනි. මේ නිසා තොටගමුවේ විජයබා පිරිවෙන සමකාලීන අනෙකුත් විද්‍යායතනයන් අතරින් විශිෂ්ටතම විද්‍යායතනය වූ බව කිව හැකිය.

**ප්‍රමුඛ පද : තොටගමුව විජයබා පිරිවෙන, සමකාලීන විද්‍යායතන, වැදගත්කම**